**ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකත්වය සඳහා හිමිවන ප්‍රතිලාභ හා දීමනා වරප්‍රසාද**

**ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය මගින්**

1. හෘද සැත්කම් සහ පිළිකා රෝග සඳහා දීමනාව. **(වසරකට වරක්)** රු. 40,000.00
2. මරණ පරිත්‍යාගය . රු. 30,000.00
3. ඇස් කණ්නාඩි සඳහා දීමනාව. **(වසර දෙකකට වරක්)** රු. 1,000.00
4. ඇසේ සුද ඉවත් කිරීමේ ශල්‍යකර්මය සඳහා දීමනාව. **(එක් ඇසකට එක් වරක් පමණි)** රු. 2,000.00
5. ශ්‍රවණාධාර සඳහා දීමනාව. **(වසර දෙකකට වරක්)** රු. 2,000.00
6. පූර්ණ අකර්මණ්‍යතාවය සඳහා දීමනාව. **(දෙඅත්,දෙපා,දෑස් අහිමිවීම හෝ සදාකාලික අංශභාග තත්වයන් සඳහා වසරකට වරක්)** රු. 7,000.00
7. අර්ධ අකර්මණ්‍යතාවය සඳහා දීමනාව. **(එක් අතක් හෝ එක් පාදයක් හෝ එක් ඇසක් අහිමි වීම හෝ තාවකාලික අංශභාග තත්වයන් සඳහා වසරකට වරක්)** රු. 3,000.00
8. රුධිර කාන්දුකරනය සඳහා. **(මසකට වරක්)** රු. 2,000.00
9. එන්ජියෝ ග්‍රැෆ් හෝ බරපතල සැත්කම් සඳහා. රු. 25,000.00
10. ඉහත රෝගී තත්වයන්ට අයත් නොවන මාරාන්තික අසනීප සඳහා. රු. 25,000.00
11. නාවික රෝහල්වල නේවාසික/බාහිර ප්‍රතිකාර පහසුකම්. **(විශ්‍රාම වැටුපක් හෝ සේවා විශ්‍රාම වැටුපක් හෝ ආබාධිත විශ්‍රාම වැටුපක් ලබන නාවික පුද්ගලයින්)**
12. නාවික මහ රෝහලෙන් යොමු කිරීමෙන් පසු කොළඹ යුධ හමුදා රෝහලෙහි නේවාසික පහසුකම්.
13. නාවික නිවාඩු නිකේතන පහසුකම්.

**ශ්‍රී ලංකා සේවා මුක්ත භට සංගමය**

1. රා.නා.හ සේවා නියුක්ත වූවන්ගේ දීමනාව (මාසිකව) රු. 2,000.00
2. හෘද සැත්කම් සඳහා දීමනාව. රු. 100,000.00 දක්වා
3. අක්ෂි ශල්‍යකර්ම සඳහා දීමනාව. රු. 8,000.00 දක්වා
4. අනෙකුත් රෝග සඳහා (වෛද්‍ය මණ්ඩලයේ නිර්දේශය අනුව) රු. 25,000.00 දක්වා
5. සුළු සැත්කම් සඳහා රු. 40,000.00 දක්වා
6. ප්‍රධාන සැත්කම් (පිළිකා/අක්මා/වකුගඩු/පෙනහලු ස්නායු සැත්කම් හා අන්ත්‍ර ආශ්‍රිත සැත්කම්) රු. 75,000.00 දක්වා
7. උපැස් යුවලක් මිළදී ගැනීම සඳහා දීමනාව. රු. 5,000.00
8. ශ්‍රව්‍ය උපකරණයක් මිළදී ගැනීම සඳහා. රු. 4,500.00
9. දරුවන් සඳහා විශ්වවිද්‍යාල දීමනාව (මාසිකව) රු. 1,500.00
10. ජීවිතාරක්ෂක ඖෂධ සඳහා දීමනාව (මාසිකව) රු. 1,000.00
11. පරීක්ෂණ සඳහා විශේෂ වියදම් එම්ආර්අයි ස්කෑන් කිරීම උපරිම රු. . 25,000.00
12. ක්‍රීඩා සඳහා ශ්‍රීලංකාව නියෝජනය කිරීමට තේරුන දරුවන් සඳහා වූ දීමනාව (ආසියානු සහ ඔලිම්පික් ක්‍රීඩා සඳහා පමණි)
13. රැකියා අවස්ථා
14. ජාත්‍යන්තරව පිළිගත් හැඳුනුම්පතක් නිකුත් කිරීම
15. සේවා මුක්ත භට සංගම් ආයතනයේ ඉදුම් හිටුම් පහසුකම්
16. බෝලගල වැඩිහිටි නිවාසයේ නේවාසික පහසුකම්
17. ශ්‍රවනාගාර සහ ආපනශාලා පහසුකම්
18. රුපියල් 250,000.00 ක මුදලක් 12% පොළි අනුපාතයක් යටතේ ණයක් ලෙස ලබා දීමට කටයුතු කිරීම.

**ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් සඳහා නේවාසික පහසුකම් ලබාදීම**

ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින්ගේ සුභසාධනය වෙනුවෙන් වැලිසර නාවික හමුදා පරිශ්‍රය තුලින් වෙන් කර දුන් ඉඩමේ ඉදිකර ඇති ශ්‍රී ලංකා නාවික හමුදා සංගම් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ සියළු පහසුකම් වලින් සමන්විත ත්‍රිත්ව ඇඳන් (Triple Bed) සහිත කාමරයක් සහ ද්විත්ව ඇඳන් (Double Bed) සහිත කාමර 2 ක් ඉදිකර ඇත. මෙම කාමර නාවික මහ රෝහලෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන සහ දුර බැහැර සිට කොළඹට පැමිණෙන නාවික හමුදා සංගමයේ සාමාජික සාමාජිකාවන්හට ප්‍රමුඛතාවය මත ලබා දීමට කටයුතු කරන අතර ආහාර පාන ඇතුළුව කාමරයක් දිනකට රු.1,000.00 ක ගාස්තු යටතේ වෙන් කර දීමට තීරණය කර ඇත.

**ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් සඳහා නිවාඩු නිකේතන වෙන් කර ගැනීම**

ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකයින් සඳහා නාවික නිවාඩු නිකේතන පහසුකම් වෙන් කිරීමේදී දියතලාව/කතරගම/අනුරාධපුරය සහ සියළුම නාවික විධානයන් යටතේ ඇති නිවාඩු නිකේතන වෙන් කර ගත හැකි අතර එම නිකේතන වෙන් කිරීමේදී මසකට පෙර නාවික හමුදා සංගමයේ ඇති අයදුම්පත පුරවා ලබා දිය යුතු අතර වැඩි විස්තර දැන ගැනීම සඳහා දු.ක 011-7193971 අමතා ලබාගත හැක.(කතරගම නිවාඩු නිකේතනය වෙන් කර ගැනීමේදී අය කර ගන්නා කුලි මුදල ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ ගිණුම් අංක 363791 ලංකා බැංකුව නගර ශාඛාව වෙත බැර කළ යුතුය.

**<u>සන්නද්ධ සේවා පුද්ගලයින් ප්‍රමුඛත්ව පදනම මත විශ්ව විද්‍යාලයන්ට ඇතුළත් කිරීම</u>**

ඉංජිනේරු, වෛද්‍ය , දන්ත වෛද්‍ය යන විෂයන්ගෙන් විශ්ව විද්‍යාල උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අපොස (උ/පෙළ) විභාගයෙන් විද්‍යාව සහ ගණිත අංශයෙන් පෙනී සිට පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති සාමාජිකයින්ගේ දූදරුවන්හට අවස්ථාවක් ලබා දීමට නාවික හමුදාව එකගත්වය පල කර ඇත.

(අ). විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා ඇති බවට නිවේදනය කර තිබීම.

(ආ). අනුමත විෂයන් 03ට අවම වශයෙන් සාමාර්ථයන් ලබා තිබීම.

(ඇ). අපොස (උ/පෙළ) සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් අවස්ථා තුනක් ඇතුලත එක් අවස්ථාවකදී හෝ ලකුණු 30ට නොඅඩුව ලබා තිබීම.

**<u>බිරිඳ සහ පවුලේ අයවලුන් විසින් දැනුවත් විය යුතු කරුණු කාරණා</u>**

ශ්‍රී ලංකා නාවික හමුදාවට බැඳී විවාහ දිවියට පත්වූ දරුවන් ලැබ විශ්‍රාම ලබා සිටිනා අප කවුරුත් තම බිරිඳ සමඟ සියළුදේ ගැන කථා කළත් ඇය අකමැති මෙන්ම කථා කිරීමට ඉඩ ප්‍රස්ථා නොදෙන විෂයක් වන්නේ ස්වාමිපුරුෂයාගේ මරණය සහ ඉන්පසු බිරිඳ හෝ දරුවන් විසින් ගත යුතු ක්‍රියා මාර්ග මොනවාද යන්න ගැන කථා කිරීමටයි.

කොපමණ අකමැති වුවත් අප බිරින්දෑවරුන් මේ සම්බන්ධයෙන් දැනුවත් විය යුත්තේ ඇයට අනිවාර්යෙන් මුහුණදීමට සිදුවන එවැනි මොහොතකදී ගත යුතු ක්‍රියා මාර්ගයන් ක්‍රමවත් කිරීමට උපකාරී වන හෙයිනි. අප මෙහි සඳහන් කිරීමට බලාපොරොත්තු වන්නේ ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයෙන් සහ ශ්‍රී ලංකා නාවික හමුදාවෙන් ඉටු කරගත යුතු කාර්යන් සම්බන්ධයෙන් දැනුවත් කිරීමකි.

**<u>අවසන් ගෞරව සේවා අවමංගල්‍ය</u>**

වසර 22ක ගෞරවනීය සේවයෙන් පසු විශ්‍රාම ගිය නාවිකයින් සඳහා පහත සඳහන් අවමංගල්‍යවාරය හිමිවනු ඇත. එහෙත් වෛද්‍යමය හේතුන් මත විශ්‍රාම ගැන්වූ නාවිකයින් හට මෙම අවමංගල්‍යවාරය හිමි නොවන අතර ක්‍රියාන්විතයේදී අබාධිතව විශ්‍රාම ගොස් සිටින නාවිකයින් හට මෙම අවමංගල්‍යවාරය හිමි වනු ඇත.

- Firing party
- Two Buglers
- Bearer Party
- Insignia Party
- Mourners (as nominated by the respective Service)

**<u>අවසන් ගෞරව සේවා අවමංගල්‍ය උත්සවයන් සහ සේවාවන් ඉල්ලුම් කිරීම</u>**

නාවික හමුදාවේ විනයගරුක මනා සේවයක් ඉටුකර විශ්‍රාම ගත් නාවික පුද්ගලයින්හට පමණක් ඔවුන් මිය යෑමේදී සේවා අවමංල්‍යයක් ලබා දීම නාවික හමුදාධිපතිතුමාගේ අනුමැතියට යටත්ව නාවික හමුදාව මගින් සිදු කරනු ලබන අතර ශ්‍රී ලංකා නාවික හමුදාව මගින් ලබා දෙන සේවාවන් (20 X 20 කූඩාරමක් , ප්ලාස්ටික් පුටු 50ක් හා නෙස්කැෆේ මැෂිමක් ) වේ. තවද රු. 30,000.00 ක මරණ පාරිතෝෂිත දීමනාවක් ශ්‍රී ලංකා නාවික හමුදා සංගමයේ සාමාජිකත්වය ඇති සියළුම සාමාජිකයින්හට ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය මගින් ලබා දෙනු ඇත. මෙසේ සේවා අවමංගල්‍යයක් හා සේවාවන් ලබා ගැනීමට අදහස් කරන්නේ නම් මිය ගිය නාවික පුද්ගලයාගේ බිරිඳ/පවුලේ සාමාජිකයෙකු විසින් කළයුතු වන්නේ නාවික පුද්ගලයා මිය ගිය බව නොපමාව මරණ සහතිකයේ පිටපතක්ද සමඟ පහත සඳහන් ආකෘතිය පරිදි සකසන ලද ලිපියක් මගින් ළඟම ඥාතියාගේ ලිඛිත ඉල්ලීමක් slnasso@navy.lk මගින් දැනුම්දීමයි.

.................................................
.................................................
.................................................

ගරු සභාපතිතුමා
ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය
ශ්‍රී ලංකානෞ ගැමුණු
වැලිසර.

**<u>සේවා අවමංගල්‍යයක් /අවමංගල්‍යය සේවාවන් ලබා ගැනීම</u>**

නාවික හමුදාවේ හිටපු (නම...................... නිල අංකය......................... වූ මාගේ ස්වාමිපුරුෂයා 20.../ / වන දින මිය ගිය බව කණගාටුවෙන් දන්වමි. එබැවින් සේවා අවමංගල්‍ය කටයුතු පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

(1). ළඟම ඥාතියාගේ නම සහ ඥාති සම්බන්ධතාවය හා දුරකථන අංකය
(2). අවමංගල්‍ය සිදු කරන ස්ථානයේ (නිවසේ) ලිපිනය
(3). ගමන් විස්තරය (නිවසට පැමිණියයුතු පැමිණිය යුතු ආකාරය කෙටියෙන් සඳහන් කරන්න)
(4). අවසන් කටයුතු පවත්වන දිනය , ස්ථානය සහ වේලාව
(5). ආදාහනය කරනවාද භූමදානය කරනවාද යන වග
(6). ශ්‍රී ලංකා නාවික හමුදා සංගමය මගින් ලබා දෙන සේවාවන් අවශ්‍ය වන කාලසීමාව